

*අද යුගයේ ගුරුවරියක ගෙන් මා අසා දැනගත් පරිදි සාරිය හෝ ඔසරිය ඇඳිය යුතු යැයි, පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන් ගේ ඇඳුම පිළිබඳව නීති පනවා ඇති පරිදි, රජයේ ගුරු පත්වීම් ලිපියේ සඳහන්ව නැත.*
*මට පෙනෙන පරිදි මේ නීතිය බොහෝ විට සමාජය විසින් ගුරුවරියන් ට උරුම කර දී, ඔවුන් විසින් ම ඉදිරියට ගෙන යන එකකි.*

## රසික සූරියආරච්චි

මා කණිෂ්ඨ විද්‍යාලයේ දෙවන ශ්‍රේණියේ ඉගෙනුම ලබද්දී අපේ පන්තිය බාර ගුරුතුමිය වුයේ සීලවතී ටීචර් ය. මා අද ඇය ගැන සිහිකරන විට හැඟෙන්නේ ඇය ඉතා ළාබාල තරුණියක් වූ බවයි. නමුත්, එද වයස අවුරුදු හයේ කුඩා දරුවන් වූ අපට, සීලවතී ටීචර් ද, අල්ලපු පන්තිය බාරව සිටි පැසුණු කොණ්ඩයෙන් යුතු නපුරු ටීචර් ද අතර ලොකු කමෙන් නම් වැඩි වෙනසක් නොවීය. තිබූ එකම වෙනස වූයේ අපේ සීලවතී ටීචර් ගේ කරුණාවන්ත බවයි.

සීලවතී ටීචර් වැටෙනු දුටු අපේ පන්තියේ සැමටම ඇතිවූයේ තරමක විනෝදාත්මක හැඟීමක් බව අමුතුවෙන් කිව යුතු නැත. පසු කළෙක ලංකාවේ ප්‍රචාරය වුණු "ඇමෙරිකාස් ෆනියස්ට් හෝම් වීඩියෝස්""යන මුළු වැඩ සටහනම පාහේ සැකසී ඇත්තේ මෙලෙස මිනිසුන් ඇද වැටෙන දර්ශන පෙන්වා, ඒවාට සිනාසීමටයි.

එලෙසම මා පසු කාලයක දැනත් කරුණක් නම්, ඒ දිනවල සීලවතී ටීචර් පාසලෙන් කලින් පිටවී ගොස් ඇත්තේ හවස් වරුවේ විශ්ව විද්‍යාලයට යාමට බවයි. අප විශ්ව විද්‍යාලයේ ගත කලේ දුක්බර සමයකැයි යන සිතුවිල්ල, සීලවතී ටීචර් උදේ පාසලේ ඉගැන්වීමටත්

# සීලවතී සිල් අරගෙන!

ඒ දිනවල අපේ පන්තියේ සිසුන්, ටීචර් ට හොරෙන් නිතර කියූ කවියක් මෙලෙස විය.

සීලවතී සිල් අරගෙන,
මාලවතී මල් අරගෙන,
කට්ට කුමංජල් අරගෙන,
පන්සල් යනවා!

කණිශ්ඨ පාඨශාලාවේ හෝඩියේ පන්තිය හෙවත් පළමු ශ්‍රේණිය ද, දෙවන ශ්‍රේණිය ද, අනෙකුත් පන්තිවලට වඩා පැයකට පමණ කලින් නිමාවට පත්වේ. පාසල් කාලය අවසාන වීම අප සනිටුහන් කරන්නේ "යෝවද තම්පව රෝමනු ජේසු" ගාථාව හඬ නගා ගැයීමෙනි.

අප පන්තියේ සිටියදීම, හෙඩ් මාස්ටර් හෙවත් ලොකු මහත්තයා ගේ කාර්යාලයට දිවයන සීලවතී ටීචර්, මට අද වැටහෙන පරිදි එහි ඇති පැමිණීමේ ලේඛණයේ අත්සන් කොට, ඉතා ඉක්මන් ගමණින් පාසල අසලින් වැටී ඇති මහ පාර දෙසට ගමන් කරන්නීය.

අපේ ගමේ ප්‍රධාන පාරේ සේවයේ යොදවා තිබුනේ එක ලංගම බසයක් පමණි. එය එක් පැත්තකට යන්නේ පැයකට එක් වරක් පමණි. සීලවතී ටීචර්, මා පෙර කී පරිදි ඉක්මන් ගමණින් පාසලෙන් පිටත්වන්නේ ඒ බස් රථයට නැගීමටයි. මේ බස් රථය ඇයට මග හැරුණොත්, එක්කෝ පැයකට වඩා වැඩි වේලාවක් පාරේ බලා සිටිය යුතුය. නැතිනම් සැතපුමක් පමණ දුරක් පයින් ගමන් කොට, අල්ලපු ගම හරහා යන බස් රථයක නැගී නගරයට යා යුතුය.

එක් දිනක් පාසල අවසානයේ පන්තියේ සිටගෙන අප "යෝවද තම්පව" සීඝ්‍රගාමී දුම්රිය පදවමින් සිටියදී, සුපුරුදු පරිදි සීලවතී ටීචර් පාසලේ සිට ගුරු පාර දිගේ මහපාර දෙසට යනු මම දුටුවෙමි. බස් රථය ලඟම එන හඬ ඇසෙන්නට ඇත. සීලවතී ටීචර් එක්වරම දුවන්නට පටන් ගත්තාය. එහෙත්, ඒ සමගම ඇය ඇද වැටිණි.

ටීචර් එලෙස බිම ඇද වැටීමට හේතුව වූයේ ඇය ඇඳ සිටි සාරිය බවට සැකයක් නැත. ඇය, වහා නැගිට්ටාය. ලජ්ජාවෙන් වටපිට බැළුවාය. පොත් පත්, බෑග් යනාදිය ඇහිඳ ගත්තාය. නැවත නොදිව්වා වුවද, වේගයෙන් පාර දෙසට ඇවිද ගියාය.

සවස විශ්ව විද්‍යාලයේ ඉගෙනීමටත් ගත් වෙහෙස ගැන සිතන විට ඉබේම අහෝසි වී යයි.

ඒ කෙසේ වෙතත්, එද සීලවතී ටීචර් එලෙස ඇද වැටෙන්නට ප්‍රධානම හේතුව වූයේ ඇය ඇඳ සිටි සාරිය බව නැවතත් කිව යුතුය. ගවුමක් හෝ, කලිසමක් හෝ ඇඳ සිටියා නම්, ඇයට එද නොවැටී ඉන්නට පමණක් නොව බස් රථය මග නොහැරෙන්නට ද ඉඩ තිබුණි.

එහෙත් එද පමණක් නොව අද වුවද, ටීචර් ලා ගවුම් හෝ කලිසම් හෝ අඩු ගණනේ සල්වාර් කමීස් හෝ ඇඳ වැඩට යාමට පෙලඹෙනු ඇතැයි මම නොසිතමි. අද යුගයේ ගුරුවරියක ගෙන් මා අසා දැනගත් පරිදි සාරිය හෝ ඔසරිය ඇඳිය යුතු යැයි, පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන් ගේ ඇඳුම පිළිබඳව නීති පනවා ඇති පරිදි, රජයේ ගුරු පත්වීම් ලිපියේ සඳහන්ව නැත.
මට පෙනෙන පරිදි මේ නීතිය බොහෝ විට සමාජය විසින් ගුරුවරියන් ට උරුම කර දී, ඔවුන් විසින් ම ඉදිරියට ගෙන යන එකකි. පිරිමි ගුරුවරුන් ට නම් කලිසම්, සරම්, වේට්ටි, රෙදි සමග කොලර් ඇති, කොලර් නැති කමිස ඕනෑම සංයෝජනයකින් ද, සිවුරු, බුෂ් කෝට්, සෆාරි සූට් යනාදී ඇඳුමින් ද සැරසී යාමට කිසිදු සමාජමය භාධාවක් නැත.

ලංකාවේ වැඩිහිටි ගැහැණුන් කොහොමටත් අඳින්නේ එක්කෝ සාරිය නැති නම් ඔසරිය නොවේද කියා මේ ප්‍රශ්ණයෙන් බැහැර වීමට හැකියාවක් නොමැත්තේ, පසු කලෙක, හතේ පන්තියේ දී අපේ ඉංගිරිසි ගුරුවරිය නිසාය. උපතින් ලන්දේසි බර්ගර් යුවතියක් වූ ඇය ගේ පෙලපත් නාමය වෑන් ඩයික් විය. ඇය ද පාසලට ආවේ සාරියකින් සැරසීගෙනයි. එය මහ ජාතියේ ඇඳුමක් සුළු ජාතියකට පැටවීමක් ලෙසින් ද අර්ථ නිරූපනය කළ හැකි ය.

අද ලංකාවේ සෑම පළාතකම පාහේ ක්‍රියාත්මක වන පෞද්ගලික සමාගම් පාසල් වල ගුරුවරියන් ගේ තත්වය මෙයින් කෙලෙසක වෙනස් වේ දැයි නිවරදව නොදනමි.

ඒ සීලවතීලා ද, දුව යමින් තම සාරි පටලා නොගෙන, සිල්ගත් විශාකාවියන් ලෙසින් ගමන් කළ යුතු බවට සමාජය අපේක්ෂා කරනවා විය යුතුය. ■

# ජපුර අවුරුදු උළෙල

ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ විද්‍යාර්ථීන්ගේ සංගමය මඟින් 3 වන වරටත් සංවිධානය කරන ලද සිංහල/දමිල අළුත් අවුරුදු උලෙල මේ මස 14 වෙනිදා ඩැකැබ ඊඩ්ඇකෑ බ්‍රැන්ඩන් පාක් ප්‍රජාශාලාවේදී විශාල ජන සහභාගීත්වයකින් පවත්වන්නට යෙදිනි. ජපුර සාමාජිකයන් විසින් සංවිධානය කරන ලද සම්ප්‍රදායික අවුරුදු කෑම මේසය විවෘත කිරීමෙන් පසු සියළුම වැඩකටයුතු ඇරඹූ අතර එයට පාරම්පරික ජන ක්‍රීඩා හා සැමට විනෝදය ගෙන දෙන අංග රැසකින් සමන්විත විය. ජපුර අවුරුදු සිඟිති කුමරිය මේ අතර විශේෂ විය.

සියළුම කටයුතු සඳහා කඨනයෙන් දායකත්වය සැපයූ තුෂාර ප්‍රනාන්දු සොහොයුරාටත්, ශ්‍රීනාත් මද්දුමගේ කලාකරුවාටත් ශබ්ද විකාශන යන්ත්‍ර සැපයූ නීල් ගමගේ සොහොයුරාටත් ප්‍රධාන මුල්‍ය අනුග්‍රහය දැක්වූ කැප්ටන් ඩ්‍රයිවින් හිදී අනුප්‍ල අධිකාරි මහතාටත්, අනෙකුත් මුල්‍ය අනුග්‍රහයන් සැපයූ සියළුම ජපුර සාමාජිකයන්ටත්, විශේෂ මාධ්‍ය අනුග්‍රහය සැපයූ සන්නස පුවත් පතටත් ජපුර අවුරුදු කමිටුවේ විශේෂ ස්තූතිය පළකර සිටිමු.

සටහන - අනුර කුලසේකර
සේයාරූ - නදීප් සිල්වා




**වැඩි පිරිසක් අතරට ඔබේ දැන්වීම ගෙනයන්න**

සන්නස වෙළඳ දැන්වීම් සඳහා විමසන්න

03 8707 4604
0402 025 516
**email**
sannasanews@gmail.com
ads.sannasa@gmail.com